0 381

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2007/2008

පෙර පාසල් අධ්‍යාපන මූලධර්ම - ESC 1121/1132

කාලය - පැය දෙකයි.

---

දිනය - 2008.03.15 වේලාව - පෙ.ව. 10.00- මධ්‍යාහ්න 12.00 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. i. පෙර පාසල් අධ්‍යාපනය යන්නෙන් ඔබ කුමක් අදහස් කරන්නේ දැයි සැකවින් දක්වන්න. (ලකුණු 08)

ii. පෙර පාසල් අධ්‍යාපනය සැපයීමේ අරමුණු පහක් (5) ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

iii. ඉහත ලැයිස්තුවේ අරමුණු අතුරින් දෙකක් (02) තෝරා ගෙන එම අරමුණු ඉටු කර ගැනීම සඳහා එක් එක් අරමුණට අදාළව පෙර පාසලක් තුළ ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් (02) බැගින් විස්තර කරන්න. (ලකුණු 12)

02. i. පූර්ව ළමාවිය අධ්‍යාපනය පිළිබඳව අදහස් ප්‍රකාශ කර තිබෙන අධ්‍යාපන දාර්ශනිකයින් දෙදෙනෙකු (02) නම් කරන්න. (ලකුණු 02)

ii. පූර්ව ළමාවිය අධ්‍යාපනය සැපයීම සම්බන්ධව ඉහත නම් කළ එක් එක් දාර්ශනිකයා විසින් ඉදිරිපත් කරන ලද අදහස් දෙක (02) බැගින් වෙන වෙනම සඳහන් කරන්න. (ලකුණු 12)

iii. ඉහත දැක්වූ අදහස් වර්තමානයේදී, පූර්ව ළමාවිය අධ්‍යාපනය සැපයීම සම්බන්ධයෙන් ඇති වැදගත්කම පැහැදලි කරන්න. (ලකුණු 11)

03. "වර්තමාන සමාජයේ, පෙර පාසල් වියේ පසුවන සෑම දරුවෙකුටම පෙර පාසල් අධ්‍යාපනයක් ලබාදීම අත්‍යවශ්‍ය වේ."

i. ඔබ එකඟ වන්නෙහි ද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ පෙර පාසල් වියෙහි පසුවන්නා වූ සියළුම ළමයින්ට පෙර පාසල් අධ්‍යාපනය සැපයීමේදී බාධාකාරී වන්නා වූ සාධක පහක් (05) පැහැදිලි කරන්න. (ලකුණු 15)

04. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ළමා අයිතිවාසිකම්
ii. දිවා සුරැකුම් මධ්‍යස්ථාන
iii. ළදරු පාසල් (kindergarten)
iv. පෙර පාසල් වියේ පසුවන සමාජමය වශයෙන් අවාසිදායක ළමුන්
v. එක්සත් රාජධානියේ පෙර පාසල් අධ්‍යාපනය

(ලකුණු 12 ½ x 2 = 25)

05. i. හොඳ පෙර පාසල් ගුරුවරියක විසින් සතු කරගත යුතු ගුණාංග පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05)

ii. මෙම ගුණාංග හොඳ පෙර පාසල් ගුරුවරියකට වැදගත් වන බවට ඔබ සලකන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. පෙර පාසල් ගුරුවරුන්ගේ අධ්‍යාපනය සහ පුහුණුව සඳහා වන වර්තමාන වැඩසටහන්වල ගුණාත්මක භාවය වර්ධනය කර ගැනීම සඳහා උපයෝගී කර ගත යුතු ක්‍රියාමාර්ග හතරක් (4) යෝජනා කරන්න.

(ලකුණු 10)

06. i. ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනයේ ඓතිහාසික සංවර්ධනය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. පෙර පාසල් අධ්‍යාපනය සංවිධානය කිරීමේදී යොදා ගත හැකි අධ්‍යාපන මූලධර්ම දෙකක් (2) සඳහන් කරන්න.

(ලකුණු 05)

iii. මෙම මූලධර්ම පදනම් කර ගෙන පෙර පාසල් අධ්‍යාපනය සංවිධානය කළ හැක්කේ කෙසේදැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -